ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date. 2026.08.20

පැමිණිලි පාර්ශවය : කේ.කේ.අයි.යූ. අරුණකුමාර මයා
අංක 241, සුනන්ද මාවත,
වල්ගම
මාතර.

වින්දිත : කේ.කේ. දිනුජය කොඩිතුවක්කු

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පති
රාහුල විද්‍යාලය,
මාතර.

**<u>පැමිණිලි අංකය HRC/HO/15/26</u>**

**<u>පැමිණිල්ල</u>**

මාතර රාහුල විද්‍යාලයේ 12 වන ශ්‍රේණියේ අධ්‍යාපනය හදාරනු ලබන කේ.කේ. දිනුජය කොඩිතුවක්කු නම් ශිෂ්‍යයා වෙත, 2025 දෙසැම්බර් මස 30 වන දින පවත්වන ලද වාර්ෂික වර්ණ ප්‍රධානෝත්සවයේදී සිදුව ඇතැයි කියන පරිපාලන අක්‍රමිකතා, අත්තනෝමතික වෙනස් කොට සැලකීම් සහ ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් එකී ශිෂ්‍යයාගේ පියා විසින් 2026.01.05 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇත.

එම පැමිණිල්ල අනුව විද්‍යාලයීය වාර්ෂික වර්ණ ප්‍රධානෝත්සවයේ දී වසරේ දක්ෂතම ක්‍රීඩකයා හා එක් එක් ක්‍රීඩාවන්ට අදාළ දක්ෂතම ක්‍රීඩකයා තේරීම සඳහා අයදුම්පත් කැඳවීම විද්‍යාලය විසින් 2025.11.30 දිනැතිව 'WhatsApp' මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන ලද නිවේදනයක් මඟින් සිදු කර ඇත. එම නිවේදනය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරන ලද අයදුම්පතක් මඟින් 2025 නොවැම්බර් මස 30 වන දින සිට 2025 දෙසැම්බර් මස 10 වන දින දක්වා අයදුම්පත් භාරදීම සඳහා කාලසීමාව නිර්ණය කර තිබී ඇත. ඒ අනුව,

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

2023/2024 වර්ෂයට අදාළ "වසරේ දක්ෂතම ක්‍රීඩකයා" (Most Outstanding Sportsman) හා වසරේ දක්ෂතම චෙස් ක්‍රීඩකයා (Most Outstanding School Chess Player of the Year) යන සම්මාන උදෙසා, දිනුජය කොඩිතුවක්කු ශිෂ්‍යයා විසින් අවශ්‍ය සියලු මූලාශ්‍ර සහතිකපත්‍ර අන්තර්ගත කරන ලද අයදුම්පත, නියමිත කාලසීමාව තුළ (2025 දෙසැම්බර් මස 08 වන දින), විද්‍යාලයීය 'WhatsApp' නිවේදනයේ දක්වා තිබූ උපදෙස් පරිදි චෙස් ක්‍රීඩාව භාර ආචාර්යවරයා වෙත විධිමත් ලෙස භාර දී ඇත.

පැමිණිලිකරු විසින් තම දරුවාගේ විශිෂ්ට ක්‍රීඩා ප්‍රතිභාව තහවුරු කරමින් පහත සඳහන් ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා කුසලතා ඉදිරිපත් කර ඇත.

1. ජාතික කණ්ඩායම් නියෝජනය: 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික චෙස් කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස තේරී පත් වී ඇති අතර, එහි සිටි ලාබාලම ක්‍රීඩකයා වීමේ ගෞරවය ඔහුට හිමිව ඇත. තවද, මාතර රාහුල විද්‍යාලයේ සියවසක ඉතිහාසය තුළ ජාතික චෙස් කණ්ඩායමක් සඳහා තේරී පත් වූ ප්‍රථම සහ එකම ක්‍රීඩකයා වන්නේ ද ඔහු බව පෙන්වා දී ඇත.

2. ජාත්‍යන්තර සහභාගීත්වය හා පදක්කම්ලාභී වීම: 2023/2024 කාල සීමාව තුළ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කීර්තිමත් ජාත්‍යන්තර ශූරතා 6ක් සඳහා සහභාගී වී රන්, රිදී සහ ලෝකඩ පදක්කම් දිනා ගැනීමට සමත්ව ඇති බව පෙන්වා දී ඇත. ඒ අතර 2024 වර්ෂයේ හංගේරියාවේ පැවති 45 වන චෙස් ඔලිම්පියාඩ් තරඟාවලියේදී ශ්‍රී ලංකාව නියෝජනය කළ අදාළ කාණ්ඩයේ රන් පදක්කම දිනා ගැනීමට දිනුජය ඇතුළු කණ්ඩායම සමත් වී ඇති බව පෙන්වා දී ඇත. තවද එම තරඟාවලියට ලෝකයේ රටවල් 197ක් නියෝජනය කරමින් සහභාගී වූ ක්‍රීඩකයන් 977 දෙනෙකු අතුරින් වැඩිම රේටින් අගයක් ලබාගත් ක්‍රීඩකයා (Top Rating Winner) ලෙස තේරී පත්වූ බවත්, මෙකී ජයග්‍රහණය මීට පෙර කිසිදු ශ්‍රී ලාංකික ක්‍රීඩකයෙකු විසින් අත්පත් කරගෙන නොමැති බවත් පෙන්වා දී ඇත.

   තවද ඔලිම්පියාඩ් තරඟාවලියේ දැක්වූ දක්ෂතා පදනම් කර ගනිමින්, ජාත්‍යන්තර චෙස් සම්මේලනය විසින් ඔහු වෙත කීර්තිමත් FIDE Candidate Master (CM) නම් සම්මාන නාමය ප්‍රදානය කර ඇති බව පෙන්වා දී ඇත. තවද මීට පෙර කිසිදු ශ්‍රී ලාංකික කණ්ඩායමක් කිසිදු අවස්ථාවක දිනා නොමැති, රුසියාවේ පැවති කීර්තිමත් Asian Cities තරඟාවලියේ ලෝකඩ පදක්කම හිමිකර ගැනීමට ද හෙතම දායක වී ඇති බව පෙන්වා දී ඇත.

3. වෙනත් ජාතික මට්ටමේ ජයග්‍රහණ: ශ්‍රී ලංකා චෙස් සම්මේලනය මගින් සංවිධානය කරන ලද වාර්ෂික සම්මාන උළෙලේදී 2024 වර්ෂයට අදාළ වසරේ දක්ෂතම පාසැල් චෙස් ක්‍රීඩකයා (Most Outstanding School Chess Player of the Year) සහ වසරේ ජනප්‍රියම චෙස් ක්‍රීඩකයා (Most

Popular Chess Player of the Year) යන සම්මාන ද්විත්වයම දිනාගෙන ඇත. අමතරව, සිය වයස් කාණ්ඩය යටතේ ජාතික යෞවන චෙස් ශූරතාවය ද දිනාගෙන ඇති බව පැමිණිලිකරු පෙන්වා දී ඇත.

මීට අමතරව, ඉහත දැක්වුණු සියලුම විශිෂ්ට ජයග්‍රහණ, සම්මාන සහ කීර්තිනාමයන් ජාතික පුවත්පත් මෙන්ම රාහුල විද්‍යාලීය නිල වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේද ප්‍රසිද්ධියට පත් කර තිබුණු බව පැමිණිලිකරු කියා සිටී.

ඉහත කී පරිදි අංගසම්පූර්ණ සහ සියලු කුසලතා සහතික සහිත අයදුම්පතක් නියමිත පරිදි ඉදිරිපත් කර තිබියදීත්, මාතර රාහුල විද්‍යාලීය බලධාරීන් විසින් වර්ණ ප්‍රධාන ක්‍රියාවලියේ දී එකී ශිෂ්‍යයා කෙරෙහි පහත සඳහන් පරිපාලනමය දෝෂ, අක්‍රමිකතා සහ අසාධාරණයන් සිදු කර ඇති බවට පැමිණිලිකරු චෝදනා නගයි.

1. අයදුම්පත් කැඳවන ලද දිනය වන විට හෝ එසේත් නැතහොත් ඊට ප්‍රථම, "දක්ෂතම ක්‍රීඩකයා" සම්මානය සඳහා තෝරාගනු ලබන නිශ්චිත ක්‍රමවේදය, ලකුණු ලබාදීමේ ක්‍රමය සහ අදාළ මූලික නිර්ණායක කිසිවක් පාසල් සිසුන්ට හෝ අයදුම්කරුවන්ට ප්‍රකාශයට හෝ ප්‍රසිද්ධියට පත් කිරීමට විද්‍යාලීය පරිපාලනය කටයුතු නොකිරීම.
2. විද්‍යාලයීය පාර්ශවයෙන් කිසිදු ආකාරයක සම්මුඛ පරීක්ෂණයක් සඳහා හෝ පැහැදිලි කිරීමක් සඳහා අදාළ ශිෂ්‍යයා කැඳවීමක් නොකිරීම.
3. ස්වාභාවික යුක්ති ධාර්මික න්‍යාය කඩකරමින් කිසිදු විනිවිදභාවයකින් තොරව, අදාළ තේරීම් ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අප්‍රකාශිතව හා ඒකපාර්ශ්විකව සිදු කිරීම.
4. චෙස් ක්‍රීඩාවෙන් අසමසම ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සුවිශේෂී ජයග්‍රහණ අත්පත් කරගත් ශිෂ්‍යයෙකු වන තම දරුවා නොසලකා හැරීම සහ අනෙකුත් ක්‍රීඩාවන්ට සාපේක්ෂව චෙස් ක්‍රීඩාවට නොසලකා හැරීමක් හා වෙනස් කොට සැලකීමක් සිදුව ඇති බව පැමිණිලිකරු අවධාරණය කරයි.

අයදුම්පත් කැඳවීමේ සිට අවසාන සම්මානලාභීන් ප්‍රකාශයට පත් කරන මොහොත දක්වා වූ සමස්ත ක්‍රියාවලියම කිසිදු විනිවිදභාවයකින් තොරව, කිසිදු පිළිගත් පරිපාලන ක්‍රමවේදයක් අනුගමනය නොකළ, අත්තනෝමතික ක්‍රියාපටිපාටියක් වූ බව පැමිණිලිකරු චෝදනා කර සිටී.

ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයේ ඉහළම පිළිගැනීමට සහ කීර්තියට ලක් වූ තමා, කිසිදු හේතුවක් නොමැතිව ඉතා අසාධාරණ ලෙස නොසලකා හැර ඇතැයි යන දැඩි මානසික පසුබැසීම සහ කම්පනයට පත්වීම නිසා, ඉන් අනතුරුව දිනුජය කොඩිතුවක්කු වන තම පුතා පාසල් යෑම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර ඇති බවද පැමිණිලිකරු කියා සිටී.

2026.05.06 දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී වත්මන් විදුහල්පතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ ප්‍රශ්නගත වර්ණ ප්‍රදානෝත්සවය සිදුවන කාලවකවානුවේ තමා රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු නොකළ බවත්, තමා 2026.04.23 දින රාහුල විද්‍යාලයේ සේවයට වාර්තා කළ බවටත්ය. කෙසේ වෙතත්, පැමිණිල්ල සම්බන්ධයෙන් සොයා බැලීමේදී පැමිණිලි පාර්ශවය පවසන පරිදි විද්‍යාලයීය වාර්ෂික වර්ණ ප්‍රධානෝත්සව ක්‍රියාවලියේ යම් යම් අඩුපාඩු පැවති බව තමාට නිරීක්ෂණය වූ බව එම පරීක්ෂණ අවස්ථාවේ දී වත්මන් විදුහල්පතිතුමා විසින් පිළිගන්නා ලදී.

එහිදී වත්මන් විදුහල්පතිතුමා විසින් පිළිගනු ලැබූ පරිපාලනමය අඩුපාඩු වූයේ,

- අයදුම්පත් කැඳවන අවස්ථාවේදී තේරීම් නිර්ණායකයන් ප්‍රසිද්ධියට පත් නොකිරීම.
- අභියාචනා (Appeals) ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා නොදීම.
- අයදුම්පත් කැඳවීමේ දුර්වලතා (WhatsApp සමූහ හරහා පමණක් තොරතුරු බෙදා හැරීම).

වසර 6කට පසු එකවර සමස්ත කාල සීමාවටම දරුවන්ගේ ජයග්‍රහණ සලකා බැලීම විශාල හා භාරදූර කාර්යයක් වූ බැවින්, මෙම අඩුපාඩුකම් සිදුවන්නට ඇතැයි විදුහල්පතිතුමා පෙන්වා දී ඇත.

ක්‍රීඩා වර්ගීකරණය සහ සම්මාන ප්‍රදානය සම්බන්ධව ස්ථාවරය ප්‍රකාශ කරමින් විදුහල්පතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ පාසල විසින් මෙතෙක් අනුගමනය කරන ලද නිර්ණායක අනුව ඔලිම්පික් ක්‍රීඩා සඳහා අනුමත ක්‍රීඩාවන්ට ප්‍රමුඛතාවය හිමි වන බවත්, අදාළ වර්ෂයේ එවැනි ජාතික මට්ටමේ දක්ෂතා දැක්වූ සිසුන් නොමැති නම් පමණක් සෙසු ක්‍රීඩා පාසල විසින් සලකා බලන බවත් සඳහන් කරමින් ඊට අදාළ නිර්ණායක ලේඛනය ඉදිරිපත් කර ඇත. තවද දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ලබා දීමේ දී **"කය වෙහෙසා සිදු කරන ක්‍රීඩා"** (Physical Sports) පදනම් කර ගනිමින් එම නිර්ණායක සකස් කළා විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙම පැමිණිල්ලේ වින්දිත දරුවා නිරත වී ඇත්තේ චෙස් (Chess) ක්‍රීඩාවට වන බැවින්, ඉහත කී පදනම මත සමස්ත දක්ෂතම ක්‍රීඩකයාගේ අවස්ථාව එම දරුවාට අහිමි වන්නට ඇතැයි තමා විශ්වාස කරන බවත්, කෙසේ වෙතත් අදාළ වර්ෂයේ චෙස් ක්‍රීඩාව සඳහා වන දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය එකී දරුවා වෙත ලබා දී ඇති බවත් විදුහල්පතිතුමා පෙන්වා දී ඇත.

මෙම ක්‍රියාවලිය තුළ කිසිදු විටෙක හිතාමතා පෞද්ගලික පලිගැනීමක් හෝ වෙනස් කොට සැලකීමක් සිදු වූවා යැයි තමා විශ්වාස නොකරන බවත්, එය වසර 6ක් වැනි විශාල කාල පරාසයක් ආවරණය කිරීමේදී ඇති වූ පරිපාලනමය හා ක්‍රියාපටිපාටික දුර්වලතා මත හටගත් තත්ත්වයක් පමණක් විය හැකි බවත් විදුහල්පතිතුමා විසින් අවසන් වශයෙන් පෙන්වා දී ඇත.

තවද, අදාළ සිදුවීම හේතුකොටගෙන වින්දිත සිසුවා පාසල් පැමිණීම ප්‍රතික්ෂේප කරන බවට පැමිණිලිකාර පියා විසින් 2026.05.06 දින පරීක්ෂණ අවස්ථාවේදී කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින්, වත්මන් විදුහල්පතිවරයා කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේ, විදුහල්පතිවරයා වශයෙන් සක්‍රියව මැදිහත් වී, අදාළ දරුවා මගපෙන්වීමකට/උපදේශනයකට ලක්කර යළි පාසල වෙත ගෙන්වා ගැනීමටත්, උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට සාමාර්ථ හිමිකර ගැනීමට හැකිවන පරිදි අධ්‍යයන පසුබිම සකසා දීමටත් බැඳී සිටින බවය.

<u>පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති සාක්ෂි</u>

01 - තොරතුරු දැනගැනීමේ පනත යටතේ රාහුල විද්‍යාලයේ විදුහල්පති වෙතින් පැමිණිලිකරු ලබාගත් 2026.03.13 දිනැති ලිපියේ පිටපතක්

02 - රාහුල විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමයේ ලේකම්ගේ 2026 මාර්තු 29 දාතම ලිපියේ පිටපතක්

03 - සම්මාන සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ WhatsApp පණිවුඩයේ පිටපතක්

04 - වර්ණ ප්‍රදානෝත්සවයේ දී යොදා ගත් නිර්ණායක ලේඛනය

05 - අධ්‍යාපන අමාත්‍යාංශයේ 35/2020 පාසල් ක්‍රීඩා චක්‍රලේඛනය

06 - ජාතික ක්‍රීඩා සංගම් නියෝග අති විශේෂ ගැසට් පත්‍රයේ (අංක 2437/24) අදාළ කොටස

07 - එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අදාළ කොටස්

08 - දිනුජය කොඩිතුවක්කු සිසුවාගේ ජයග්‍රහණ සහිතව රාහුල විද්‍යාලයට යොමු කල අයදුම් පත්‍රයේ පිටපත

09 - දිනුජය කොඩිතුවක්කු සිසුවාගේ සහ 2023/2024 වර්ෂයේ මාතර රාහුල විද්‍යාලයේ දක්ෂතම ක්‍රීඩකයා බවට පත් වූ සිසුවාගේ ජයග්‍රහණ සම්බන්ධයෙන් වර්ණ ප්‍රදානෝත්සව දින ප්‍රකාශයට පත් කර තිබූ සඟරාවේ අදාළ පිටු.

<u>නිරීක්ෂණ</u>

මාතර රාහුල විද්‍යාලයේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ සිය දරුවාට පාසල මඟින් පවත්වන ලද වාර්ෂික වර්ණ ප්‍රදානෝත්සවයේදී සිදුව ඇතැයි කියන පරිපාලන අක්‍රමිකතා හා වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් එම දරුවාගේ පියා වන පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර තිබූ පැමිණිල්ල ප්‍රකාරව පැමිණිලි පාර්ශවය හා වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාව හමුවට කැඳවා සාක්ෂි හා ප්‍රකාශ සටහන් කරගෙන ඇත. පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළ කරුණු ද, පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකරු සහ වගඋත්තරකරු විසින් සිදු කරන ලද කරුණු දැක්වීම් ද, ද්විපාර්ශවීය වාර්තා හා ලිඛිත දේශන ද ඇතුලුව, මේ දක්වා මෙම සිදුවීමට අදාළව පරිශීලනයට ලක්වූ සමස්ත සාක්ෂි සහ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.

- 2019-2024 දක්වා වර්ෂ සඳහා වූ මාතර රාහුල විද්‍යාලයේ වර්ණ ප්‍රධානෝත්සවය 2025 දෙසැම්බර් 30 වැනි දින එම විද්‍යාලයේ දී පවත්වා ඇත. එහි දී, 2023/2024 වර්ෂයට අදාළ වර්ෂයේ **වෙස් ක්‍රීඩාව සඳහා දක්ෂතම ක්‍රීඩකයාට** හිමි සම්මානය වින්දිත සිසුවා වන දිනුජය කොඩිතුවක්කු හට හිමි වී ඇත. නමුත් එම වර්ණ ප්‍රධානෝත්සවයේ දී, **2023/2024 වර්ෂයට අදාළ දක්ෂම ක්‍රීඩකයාට** හිමි සම්මානය සඳහා සියලු දක්ෂතා, ජයග්‍රහණ සහ සම්මාන සනාථ කෙරෙන සහතික පත්‍ර සහ අනෙකුත් ලිපි ලේඛන ඇතුලත් අංග සම්පූර්ණ අයදුම් පත්‍රයක් නියමිත පරිදි ඉදිරිපත් කළ ද වින්දිත සිසුවා සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමක්, හෝ වෙනත් කිසිඳු ආකාරයක ඒ පිළිබඳ දැනුම් දීමක් පාසල මඟින් ඔහු වෙත සිදු නොකරන ලද බවට වින්දිත සිසුවාගේ පියා වන පැමිණිලිකරු චෝදනා කර සිටී. එම චෝදනාවට අමතරව මෙම වර්ණ ප්‍රදානය කිරීමේ දී පහත සඳහන් මූලික දෝශ සහ අක්‍රමිකතාවයන් තිබූ බවට පැමිණිලි පාර්ශවය විසින් චෝදනා කර ඇත.

    1) අයදුම්පත් කැඳවන දින වනවිට හෝ ඊට ප්‍රථම උක්ත සම්මානයට අදාළ දක්ෂතම ක්‍රීඩකයා තෝරාගන්නා ක්‍රමවේදය සහ අදාළ නිර්ණායක ප්‍රකාශයට හෝ ප්‍රසිද්ධියට පත් නොකිරීම.
    2) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට නොකැඳවීම මඟින් අයදුම්කරුවන්ට තමන් වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා නොදීම.
    3) උක්ත සම්මානය සඳහා සුදුසුකම් ලැබුවේ කවරෙක්ද යන්න වර්ණ ප්‍රදානෝත්සව මොහොත තෙක් ප්‍රකාශයට සහ ප්‍රසිද්ධියට පත් නොකිරීම.
    4) අභියාචනා සඳහා අවස්ථාවක් ලබා නොදීම.
    5) අයදුම් පත්‍ර කැඳවීමේ සිට සම්මානලාභීන් ප්‍රකාශයට පත් කරන මොහොත දක්වා වූ සම්පූර්ණ ක්‍රියාවලිය කිසිඳු විනිවිදභාවයකින් තොර, පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය නොකල ක්‍රියාපටිපාටියක් වීම.

- උක්ත සඳහන් කරුණු යටතේ දක්වා ඇති අක්‍රමිකතාවයන් සහ පටිපාටිගත දෝෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂිමය පදනම පැමිණිලි පාර්ශවය විසින් ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර ඇත.

ඒ අනුව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව පැමිණිලිකරු විසින් 2025 දෙසැම්බර් 30 දිනැතිව මාතර රාහුල විද්‍යාලයේ තොරතුරු නිලධාරී වෙත යොමු කරන ලද, නිශ්චිත ප්‍රශ්න 14 කින් සමන්විත RTI 01 අයදුම්පතට පිළිතුරු වශයෙන් 2026 මාර්තු 13 දිනැතිව විදුහල්පතිවරයාගේ අත්සනින් නිකුත් කරන ලද නිල ලේඛනයේ පිටපතක් පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලෙස ඉදිරිපත් කර තිබේ.

එම ලේඛනයේ 04 වන අනුඡේදය මගින් 2023/2024 වර්ෂය සඳහා වන දක්ෂතම ක්‍රීඩකයා තේරීමේ නිර්ණායක (selection criteria) සම්බන්ධයෙන් අදාළ අයදුම්කරුවන්/ක්‍රීඩකයන්, පුහුණුකරුවන්, ක්‍රීඩා භාර ආචාර්යවරුන් සහ මව්පියන්/භාරකරුවන් පෙර දැනුවත් කිරීමට පියවර ගත්තේ ද යන්න විමසා ඇත. එමෙන්ම 05 වන අනුඡේදය මගින්, එසේ දැනුවත් කර ඇත්නම් එම එක් එක් පාර්ශව දැනුවත් කරන ලද නිශ්චිත දිනය, වේලාව සහ දැනුවත් කිරීමේ මාධ්‍යය/ක්‍රමවේදය වෙන් වෙන් වශයෙන් විමසා ඇත.

එකී විමසීම් සඳහා වගඋත්තරකාර පාසල් අධිකාරිය ලබා දී ඇති තොරතුරු පරීක්ෂා කිරීමේදී,

- 04 වන ප්‍රශ්නයට පිළිතුරු ලෙස දක්වා ඇත්තේ තේරීම් නිර්ණායක පිළිබඳව ක්‍රීඩා භාර ආචාර්යවරුන් පමණක් දැනුවත් කර ඇති බවයි.
- 05 වන ප්‍රශ්නයට පිළිතුරු ලෙස දක්වා ඇත්තේ වර්ණ ප්‍රදානය සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ ක්‍රීඩකයින් විසින්ම වන බැවින්, වෙනම දැනුවත් කිරීමක් සිදු නොකරන බවයි.

එනයින් තේරීම් ක්‍රමවේදය සහ නිර්ණායක පිළිබඳව අයදුම්කාර ක්‍රීඩකයින් හෝ ඔවුන්ගේ දෙමාපියන්/භාරකරුවන් පූර්ව දැනුවත් කිරීමකට ලක් කර නොමැති බවත්, අයදුම්පත් කැඳවීමේ අවස්ථාව වන විට එකී නිර්ණායක ප්‍රසිද්ධියට පත් කර නොතිබූ බවත් වගඋත්තරකාර පාර්ශවයේ එකී නිල පිළිතුර මගින් පිළිගෙන ඇත. මෙය ස්වාභාවික යුක්ති මූලධර්ම සහ විනිවිදභාවය උල්ලංඝනය කිරීමක් ලෙස පැමිණිලිකරු චෝදනා කර සිටී. පාසල තුළ දීර්ඝ කාල පරාසයකට පසුව සංවිධානය කරනු ලබන මෙවැනි වර්ණ ප්‍රදානෝත්සවයකදී, විශේෂයෙන්ම පාසල් සිසුන් හා බැඳුණු කටයුත්තකදී, දෙමාපියන් සහ භාරකරුවන්ගේ මතයන් හා අදහස් විමසීම වැදගත් වේ. එබඳු විනිවිදභාවයෙන් යුතු ප්‍රවේශයක් මගින් අදාළ කාර්යයේ නීත්‍යානුකූලභාවය මෙන්ම සාර්ථකත්වයද තහවුරු කෙරේ. එබැවින්, ඒ පිළිබඳව දෙමාපියන් සහ භාරකරුවන් පූර්වයෙන් දැනුවත් කිරීම වැදගත් කොන්දේසියක් ලෙස සලකනු ලබන බව කොමිෂන් සභාවේ අදහස වේ.

තවද, එකී තොරතුරු අයදුම්පතෙහි 11 වන අනුඡේදය මගින් 2023/2024 වර්ෂය සඳහා වන දක්ෂතම ක්‍රීඩකයා ලෙස තේරී පත් වූ තැනැත්තා කවුරුන්ද යන්න නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද දිනය, වේලාව සහ ප්‍රසිද්ධ කරන ලද ආකාරය/මාධ්‍යය පිළිබඳව විමසා ඇත. ඊට අදාළව වගඋත්තරකාර පාසල් අධිකාරිය සපයා ඇති තොරතුරු පරීක්ෂා කිරීමේදී තහවුරු වන්නේ, තේරී පත් වූ ක්‍රීඩකයා කවරෙක්ද යන්න ක්‍රීඩා භාර ආචාර්යවරයා මගින් අදාළ තේරීම්ලාභී ක්‍රීඩකයාට පමණක් පෞද්ගලිකව දැනුම් දෙනු ලබන බවයි. එනයින්, එකී විශිෂ්ටතා සම්මානය සඳහා සුදුසුකම්

ලැබූ ක්‍රීඩකයාගේ නාමය, වර්ණ ප්‍රදානෝත්සව මොහොත දක්වාම ප්‍රසිද්ධියට පත් කිරීමක් හෝ ප්‍රසිද්ධ දැනුම්දීමක් සිදු නොකළ බවට වන කරුණ වගඋත්තරකාර පාර්ශවය විසින් නිල වශයෙන් පිළිගෙන ඇත.

මෙලෙස තේරීම් නිර්ණායක ක්‍රීඩා භාර ආචාර්යවරුන් වෙත පමණක් සීමා කිරීම මගින් හා දක්ෂතම ක්‍රීඩකයා ලෙස තේරී පත් වූ තැනැත්තා කවුරුන්ද යන්න වර්ණ ප්‍රදානෝත්සව මොහොත දක්වාම ප්‍රසිද්ධියට පත් නොකිරීම මගින් අදාළ ක්‍රියාවලියේ රහස්‍යභාවය පවත්වා ගැනීමට පාසල් පරිපාලනය අපේක්ෂා කළා විය හැකි වුවද, වෙනත් ප්‍රසිද්ධ පාසල්හි වර්ණ ප්‍රදානෝත්සවයන් පැවැත්වීමේදී ජයග්‍රාහකයින් ප්‍රසිද්ධියට පත් කරමින්, ඊට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් සාධාරණ කාලයක් ලබා දීමේ පරිපාලන සම්ප්‍රදාය පවතින බවට කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත්ව ඇත. ඒ අනුව, ස්වාභාවික යුක්තියේ පදනම් ප්‍රතිපත්තිවලට අනුකූලව මාතර රාහුල විද්‍යාලයද එබඳු විනිවිදභාවයෙන් යුතු සහ සාධාරණ ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීම වඩාත් යෝග්‍ය වන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

තවද, එකී තොරතුරු අයදුම්පතෙහි 08 වන අනුඡේදය මගින් එක් එක් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබූ නිශ්චිත දිනය හා වේලාව පිළිබඳව විමසා ඇත. ඊට අදාළව වගඋත්තරකාර පාසල් අධිකාරිය සපයා ඇති තොරතුරුවල සඳහන් වන්නේ, සහතික පත්‍ර ඇගයීමට ලක්කිරීම මගින් පමණක් තේරීම සිදුකරන ලද බැවින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු නොලබන බවයි. තවද, රාහුල විද්‍යාලයීය වර්ණ ප්‍රදානෝත්සවයට අදාළව 2019/2020, 2021/2022 සහ 2023/2024 යන වර්ෂයන් සඳහා විශිෂ්ටතම ක්‍රීඩකයා තේරීමේ ක්‍රියාවලියේදී, විදුහල්පතිවරයා ප්‍රමුඛ පාසල් කළමනාකරණ කමිටුව විසින් නිල වශයෙන් පත් කරන ලද තේරීම් කමිටුවක් මගින් අදාළ ඇගයීම් සිදු කරන ලද බවට වගඋත්තරකාර මාතර රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ 2026.02.12 දිනැති වාර්තාව මගින්ද මෙම කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත.

එකී වාර්තාවට අනුව, අයදුම්පත් ඉදිරිපත් කළ ක්‍රීඩකයින් අතුරින් මූලික සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් පමණක් ප්‍රථමයෙන් සලකා බලා ඇත. ඉන් අනතුරුව, ක්‍රීඩා භාර ආචාර්යවරුන් විසින් අදාළ වර්ෂය තුළ ඒ ඒ ක්‍රීඩා අංශයන්ගෙන් ඉහළම කුසලතා දක්වා ඇති ක්‍රීඩකයින්ගේ සහතික පත්‍ර ඇතුලු ප්‍රාථමික ලේඛනමය සාක්ෂි තේරීම් කමිටුව හමුවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අනුමත තේරීම් පටිපාටියට අනුකූලව අදාළ වර්ෂයන් වෙනුවෙන් ඉහළම සුදුසුකම් සපිරූ ක්‍රීඩකයින් තිදෙනා බැගින් විශිෂ්ටතම ක්‍රීඩකයින් ලෙස නාමයෝජිත කර ඇති බව වැඩිදුරටත් වාර්තා කර ඇත. එනයින් අදාළ තේරීම් පටිපාටිය සඳහා කිසිදු සම්මුඛ පරීක්ෂණයක් නොපැවැත්වූ බව වගඋත්තරකාර පාර්ශවය විසින් නිල වශයෙන් පිළිගෙන තිබේ. සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී

සිටිමින් තමා වෙනුවෙන් කරුණු දැක්වීමේ අවස්ථාවකට සෑම සිසුවෙකුම සුදුසු වන අතර, එය සාධාරණ, විනිවිදභාවයෙන් යුතු මෙන්ම ස්වාභාවික යුක්තිධර්මයට අනුකූල හා සහභාගීත්වයේ මූලධර්මයට ද එකඟ වන ඕනෑම පරිපාලන ක්‍රියාවලියක මූලික හා අත්‍යවශ්‍ය අංගයක් ලෙස කොමිෂන් සභාවට පෙනී යයි.

- එලෙසම, එකී තොරතුරු අයදුම්පතෙහි 12, 13 සහ 14 යන අනුඡේදයන් මගින් විමසා ඇති අභියාචනා පටිපාටිය සම්බන්ධ තොරතුරු සඳහා වගඋත්තරකාර පාසල් අධිකාරිය විසින් "අදාළ නොවේ" යනුවෙන් සපයා ඇති පිළිතුර මගින්, අදාළ තේරීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට කිසිදු ඉඩකඩක් හෝ අවස්ථාවක් තේරීම්ලාභීන් නොවන අයදුම්කරුවන්ට ලබා දී නොමැති බවට වන පැමිණිලි පාර්ශවයේ චෝදනාව වගඋත්තරකාර පාර්ශවය විසින් පිළිගෙන ඇත. මෙය යුක්තිසහගත ක්‍රියාපටිපාටියක ඇති මූලික අංගයක් වන අභියාචනා කිරීමේ අයිතිය නොසළකා හැරීමක් වන අතර, විශේෂයෙන්ම දිවයිනේ ප්‍රමුඛ පෙළේ පාසල්හි වර්ණ ප්‍රදානෝත්සවයන්ට අදාළව, පාසල් සිසුන් උදෙසා අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවන් සලසා දීමේ පරිපාලනමය ක්‍රියාපටිපාටියක් පවතින බවට කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් වී ඇත.

  තවද, එකී තොරතුරු අයදුම්පතෙහි 10 වන අනුඡේදය මගින් තේරීම් නිර්ණායකයන්ට අනුකූලව එක් එක් අයදුම්කරු ලබාගත් ලකුණු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් විමසා ඇති අතර, ඊට අදාළව සපයා ඇති තොරතුරු පරීක්ෂා කිරීමේදී ලබා දී ඇති පිළිතුර වන්නේ "තේරීම් ක්‍රමවේදයට අදාළව ලකුණු ලබා දීමක් සිදු නොවේ" යනුවෙන් වන අතර එමගින් නිරීක්ෂණය වන්නේ ලකුණු ලබාදීමේ ක්‍රියාවලියක් සිදුකර නොමැති බවයි. දක්ෂතම ක්‍රීඩකයා තේරීම සඳහා ප්‍රකාශයට පත්කරන ලද නිර්ණායකයන්ට අනුකූලව වුවද, ලකුණු පිරිනැමීමක් හෝ අයදුම්කරුවන්ගේ සුදුසුකම් සලකා බලා ප්‍රමුඛතා ලැයිස්තුගත කිරීම සඳහා යොදාගන්නා ලද නිශ්චිත පටිපාටියක් හෝ අදාළ තේරීම සිදුකරන ලද ආකාරය පැහැදිලි කෙරෙන නිල ඇගයීම් වාර්තාවක් වගඋත්තරකාර පාසල් අධිකාරිය විසින් සකස් කර නොමැති බවට පැමිණිලි පාර්ශවය විසින් වගඋත්තර පාර්ශවය වෙත නැගූ චෝදනාව එකී පිළිතුර මඟින් නිල වශයෙන් අනුමත කර ඇත. එනයින්, දක්ෂතම ක්‍රීඩකයා තේරීමේදී අදාළ නිර්ණායකයන්ට අනුකූලව ලකුණු ලබාදීමක් හෝ විධිමත් තේරීම් ක්‍රමවේදයක් අනුගමනය කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත් වී ඇති බව තහවුරු වේ.

- තවද, උක්ත වර්ණ ප්‍රදානෝත්සවය සඳහා මූල්‍යමය අනුග්‍රහය ලබා දුන් මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම්වරයාගේ අත්සනින් යුතුව 2026 මාර්තු 29 දිනැතිව රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කරන ලද නිල ලිපියේ පිටපතක් ද පැමිණිලි පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලෙස ලේඛනගත කර ඇත.

එකී ලේඛනයේ 06 වන අනුඡේදය මගින්:

"ත්‍යාග ප්‍රදානෝත්සවයේ/ක්‍රීඩා වර්ණ රාත්‍රියේ ගෙවුණු වසර 6 සඳහා විශිෂ්ටතම ශිෂ්‍යයින් තේරූ ක්‍රමවේදය සාධාරණ යැයි නොහැඟෙන බව දක්වා ඇත. එම තේරීම් ක්‍රියාවලිය තුළ යම් දරුවෙකුට සැලසුම්සහගත ලෙස අසාධාරණයක් කළේ යැයි තම සංගමය අදහස් නොකරන බවත්, එම තේරීම් ක්‍රියාවලිය තුළ නිශ්චිත නිර්ණායක ප්‍රකාශයට පත් නොකර අභියාචනා අවස්ථාද නොමැතිව ඇතැම් දරුවන් අගතියට ලක් වූ බව හැඟේ..." යනුවෙන් දක්වා ඇති අයුරු නිරීක්ෂණය වේ.

එනයින්, තේරීම් නිර්ණායක පූර්වයෙන් ප්‍රකාශයට පත් නොකිරීම සහ අභියාචනා අවස්ථාවන් ලබා නොදීම මගින් අදාළ ක්‍රීඩකයින් අගතියට පත් වූ බවට පැමිණිලි පාර්ශවය නැගූ ස්වාභාවික යුක්තිධර්මයේ මූලධර්ම උල්ලංඝනය වීමේ පටිපාටිගත අක්‍රමිකතාව, එකී වර්ණ ප්‍රදානෝත්සවයේ ප්‍රධාන මූල්‍ය දායකයා වන ආදි ශිෂ්‍ය සංගමය විසින් ද ස්වකීය ලිඛිත ප්‍රකාශනය මගින් සනාථ කර ඇත.

- තවද, උක්ත වර්ණ ප්‍රදානෝත්සවයේ සම්මාන සඳහා අයදුම්පත් කැඳවීමට අදාළව, පාසල විසින් 17න් පහළ වෙස් WhatsApp සමූහය වෙත යොමු කරන ලද 2025.11.30 දිනැති පණිවිඩයේ පිටපතක් ද පැමිණිලි පාර්ශවය විසින් සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇත.

එකී සන්නිවේදනය පරීක්ෂා කිරීමේදී:

2019-2024 වර්ෂ සඳහා වන ක්‍රීඩා වර්ණ ප්‍රදානය 2025 වසර අවසානයේ පැවැත්වීමට තීරණය කර ඇති බවත්, අධ්‍යාපන අමාත්‍යාංශය, අදාළ පාසල් ක්‍රීඩා සංගම් සහ ජාතික සංගම් මගින් සංවිධානය කරන ලද තරඟවල 2019 සිට 2024 දක්වා දකුණු පළාත් මට්ටමේ සහ ඉන් පහළ ජයග්‍රහණවලට අදාළ සහතික පත්‍රවල ඡායා පිටපත් සහිත ලිපිගොනු 2025.12.10 දිනට පෙර අදාළ ක්‍රීඩා භාර ආචාර්යවරුන් වෙත භාරදිය යුතු බවත් එහි දක්වා ඇත. එම ලිපිගොනු ක්‍රීඩා භාර ආචාර්යවරුන් විසින් 2025.12.12 දිනට පෙර ක්‍රීඩා අංශය වෙත භාරදිය යුතු බවටත්, ක්‍රීඩා එකකට වඩා නිරත වන සිසුන් ඒ ඒ ක්‍රීඩාව සඳහා වෙන වෙනම ලිපිගොනු ඉදිරිපත් කළ යුතු බවටත් එමගින් උපදෙස් දී ඇත.

කෙසේ වෙතත්, එකී පණිවිඩය තුළ තේරීම් සිදුකරන ක්‍රමවේදය හෝ ඇගයීම් නිර්ණායක පිළිබඳව කිසිදු සඳහනක් කර නොමැති බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

තවද, 2023/2024 වර්ෂය සඳහා වන දක්ෂතම ක්‍රීඩකයා තේරීමේ අයදුම්පත් කැඳවීම සිදුකර ඇත්තේ එකී WhatsApp පණිවිඩය මගින් පමණක් වන බව, 2026 මැයි 06 වන දින මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලබා දෙමින් මාතර රාහුල විද්‍යාලයේ වත්මන් විදුහල්පතිවරයා

විසින් පිළිගෙන ඇත. එලෙසම, පැමිණිලිකරුගේ RTI 01 තොරතුරු අයදුම්පතට පිළිතුරු වශයෙන් පාසල් අධිකාරිය විසින් ලබාදී ඇති 2026.03.13 දිනැති ලිපියේ 01 වන අනුඡේදය මගින් ද, අයදුම්පත් කැඳවීම නිවේදනය කරන ලද්දේ WhatsApp සමූහ හරහා පමණක් බවට වගඋත්තරකාර පාර්ශවය විසින් පිළිගෙන තිබේ. අයදුම්පත් කැඳවීමේ මූලික නිවේදනය සමගින් තේරීම් නිර්ණායක ප්‍රකාශයට පත් කිරීමට, සන්නිවේදනය කිරීමට හෝ අයදුම්කරුවන්ට ලබා දීමට වගඋත්තරකාර පාසල් අධිකාරිය අපොහොසත් වීම මගින් පටිපාටිගත සහ නීතිමය දෝෂයන් පැහැදිලිව තහවුරු වේ.

තවද ප්‍රමුඛ පෙළේ රජයේ පාසලක වසර කිහිපයක එකතු වූ ඉතා වැදගත් වර්ණ ප්‍රදානෝත්සවයක් වැනි නිල කටයුත්තක් සඳහා WhatsApp පණිවිඩයකට පමණක් සීමා වී ප්‍රචාරය කිරීම මඟින් ඒ සම්බන්ධව පාසැල් ප්‍රජාවට ප්‍රමාණවත් ලෙස සන්නිවේදනය නොවීම බරපතල පටිපාටිගත දෝෂයකි. පාසලේ නිල වෙබ් අඩවිය හෝ පාසල් පරිශ්‍රයේ නිල දැන්වීම් පුවරුවක් වැනි ප්‍රමිතිගත මාධ්‍යයක් මගින් සාධාරණ සහ පූර්ණ ප්‍රසිද්ධියක් ලබාදීමට හැකියාව පවතිද්දී වගඋත්තරකාර පාර්ශවය ඒ පිළිබඳව අවධානය යොමු කර නොමැති බව පෙනී යයි.

- ඊට අමතරව, ඉහත දැක්වුණු පටිපාටිගත දෝෂයන් සහ අක්‍රමිකතාවයන් බොහොමයක් 2026 මැයි 06 වන දින මෙම කොමිෂන් සභාව හමුවේ පැවැති පරීක්ෂණයේදී සාක්ෂි විමසීමට ලක්කළ අවස්ථාවේ මාතර රාහුල විද්‍යාලයේ වත්මන් විදුහල්පතිවරයා විසින් නිල වශයෙන් පිළිගන්නා ලදී.

  එකී මූලික දෝෂයන් සහිතව මෙම තේරීම් පටිපාටිය සහ වර්ණ ප්‍රදානෝත්සවය පැවැත්වීම මගින් වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත සිසුවාට ඇති සාධාරණ සළකා බැලීමකට ඇති අයිතිය, තීරණ ගැනීමේදී ප්‍රදර්ශනය කල යුතු හේතු සහගත බව, සාධාරණභාවය, සමානත්වය ආදී මූලික අංග නොසළකා හැර ඇති බවට පැමිණිලිකරු චෝදනා කර සිටී. එකී පටිපාටිගත උල්ලංඝනයන් සරල "අත්වැරදීම්" හෝ "අඩුපාඩුකම්" ලෙස අර්ථ දැක්වීමට වත්මන් විදුහල්පතිවරයා උත්සාහ කළද, වර්ණ ප්‍රදානෝත්සවයක් වැනි සිසුන්ගේ අනාගත අපේක්ෂාවන්ට බලපාන තීරණ ගැනීමේ ක්‍රියාවලියක පවතින මෙවැනි මූලික දෝෂයන් ලිහිල්ව සලකා බැහැර කළ නොහැකි බව කොමිෂන් සභාවේ අදහස වේ.

- තවද, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අයදුම්පතට පිළිතුරු වශයෙන් රාහුල විද්‍යාලයීය පාසල් අධිකාරිය මගින් ලබාදී ඇති 2026.03.13 දිනැති ලිපියේ 03 වන අනුඡේදයට අදාළව සපයා ඇති තොරතුරු මගින්, උක්ත වර්ණ ප්‍රදානෝත්සවයේදී යොදාගත් බවට දක්වන තේරීම් නිර්ණායක මාලාව (selection criteria) ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති එකී නිර්ණායකයන් අතුරින් බහුතරයක් අතාර්කික, සාධාරණ පදනමකින් හා විනිවිදභාවයකින් තොර, සහ පරමාර්ථ සාධනය සඳහා කිසිදු තාර්කික සබඳතාවක් නොමැති නිර්ණායක වන බවට පැමිණිලිකරු චෝදනා කර සිටී. විශේෂයෙන්ම වර්ණ ප්‍රදානෝත්සවයේදී යොදාගන්නා ලද නිර්ණායක ලේඛනයෙහි ක්‍රීඩා සුදුසුකම් යටතේ, **ඔලිම්පික් තරග සඳහා අනුමත ක්‍රීඩාවන්ට** (Olympic sports) **ප්‍රමුඛත්වය හිමිවීම** යන නිර්ණායකය යොදාගැනීම අසාධාරණ බවට පැමිණිලිකරු චෝදනා කර සිටී.

පැමිණිලිකරුගේ එකී චෝදනාව මත පදනම්ව ප්‍රශ්නගත වර්ණ ප්‍රදානෝත්සවයේදී යොදාගන්නා ලදැයි පැවසෙන නිර්ණායක ලේඛනය පරීක්ෂා කිරීමේ දී දක්ෂතම ක්‍රීඩකයා තේරීමේදී ක්‍රීඩා සුදුසුකම් යටතේ, ඔලිම්පික් තරග සඳහා අනුමත ක්‍රීඩාවන්ට ප්‍රමුඛත්වය හිමිවන බවට එහි දක්වා ඇති අයුරු නිරීක්ෂණය වේ. දක්ෂතම ක්‍රීඩකයා තේරීමේදී ඔලිම්පික් ක්‍රීඩාවන්ට ප්‍රමුඛතාව ලබා දීමේ පාසල් ප්‍රතිපත්තිය තුළින්, ඔලිම්පික් නොවන අනෙකුත් ක්‍රීඩාවන් පූර්ණ වශයෙන් බැහැර කිරීමක් හෝ අහෝසි කිරීමක් එයින් අභිප්‍රේත වන්නේ යැයි අර්ථ නිරූපණය කළ නොහැක.

කෙසේ වෙතත්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2020 දෙසැම්බර් 16 දිනැති අංක 35/2020 දරන චක්‍රලේඛය ප්‍රකාරව, පාසල් සිසුන්ට නිරත විය හැකි ක්‍රීඩා 32 ක් අනුමත කර නිශ්චිතව දක්වා ඇත. එකී චක්‍රලේඛ විධිවිධාන මගින් එම සියලුම ක්‍රීඩාවන් සමාන පදනමක තබා සලකා ඇති අතර, කිසිදු ක්‍රීඩාවකට අනෙක් ක්‍රීඩාවන් අභිබවා යම් ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු බවට දක්වා නොමැත. එසේ තිබියදී, අදාළ චක්‍රලේඛ විධිවිධාන අභිබවා යමින් ඔලිම්පික් ක්‍රීඩාවන්ට පමණක් ප්‍රමුඛත්වය ලබා දෙමින් තේරීම් නිර්ණායක සකස් කිරීමට වගඋත්තරකාර පාසල් අධිකාරිය කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

2026 මැයි මස 06 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවැති පරීක්ෂණයේදී සාක්ෂි ලබා දෙමින්, වගඋත්තරකාර රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ප්‍රකාශ කර ඇත්තේ, දක්ෂතම ක්‍රීඩකයා තේරීමේදී කය වෙහෙසා සිදුකරන ක්‍රීඩා (physical sports) සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇති බවයි. කෙසේ වෙතත්, එලෙස කය වෙහෙසා සිදුකරන ක්‍රීඩා සහ/හෝ ඔලිම්පික් ක්‍රීඩා සඳහා ප්‍රමුඛතාව හිමිවන බවට වන තේරීම් පදනම, දක්ෂතම ක්‍රීඩකයා තේරීම සඳහා අයදුම්පත් කැඳවන ලද WhatsApp නිවේදනය මගින් හෝ වෙනත් කිසිදු පූර්ව නිල මාධ්‍යයක් මගින් ප්‍රසිද්ධ කිරීමට වගඋත්තරකාර පාසල් අධිකාරිය කටයුතු කර නොමැති බවද පැහැදිලිව නිරීක්ෂණය වේ. එසේම ඔලිම්පික් ක්‍රීඩාවලට ප්‍රමුඛතාවය දිය යුතු බවට නිර්ණායක සැකසීමට පදනම් කරගත් වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කර සිටින කරුණු කොතරම් සාධාරණ ද යන්න හෝ තාර්කිකද යන්න ගැටලු සහගත වන බව කොමිෂන් සභාවට පෙනී යයි.

මෙම අතාර්කික පටිපාටිය මගින් චෙස් ක්‍රීඩාව අනෙකුත් අනුමත ක්‍රීඩාවන් හා සමාන පදනමක තබා නොසැලකීම මගින් තම දරුවාට මෙන්ම පාසලේ අනෙකුත් චෙස් ක්‍රීඩකයින්ට අසමාන ලෙස සැලකීමක් සිදු කර ඇති බවද පැමිණිලිකරු වැඩිදුරටත් චෝදනා කරන සිටී. "2019-2024 වර්ණ රාත්‍රිය" නමින් රාහුල විද්‍යාලය මගින් ප්‍රකාශිත සමරු සංග්‍රහයෙහි වර්ණලාභීන්ගේ ජයග්‍රහණ සහ කුසලතා ලේඛනගත කර ඇති අතර, එකී සමරු සංග්‍රහය පැමිණිලිකාර පාර්ශවය විසින් සාක්ෂියක් ලෙස කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කර ඇත.

එකී සමරු සංග්‍රහයෙහි අන්තර්ගතය පරීක්ෂා කිරීමේදී, 2023/2024 වර්ෂය සඳහා රාහුල විද්‍යාලයේ විශිෂ්ටතම ක්‍රීඩකයා ලෙස සම්මානිත සිසුවාගේ ජයග්‍රහණ ජාතික මට්ටමේ මලල ක්‍රීඩා ජයග්‍රහණවලට පමණක් සීමා වී ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත්, 2023/2024 වර්ෂයේ රාහුල විද්‍යාලයේ විශිෂ්ටතම චෙස් ක්‍රීඩකයා ලෙස තේරී පත්වුණු හා 2023/2024 වර්ෂයේ රාහුල විද්‍යාලයේ විශිෂ්ටතම ක්‍රීඩකයා වීමට අවස්ථාව අහිමි වූවා යැයි චෝදනා කරන මෙම පැමිණිල්ලේ අගතියට පත් සිසුවා, ශ්‍රී ලංකා ජාතික චෙස් කණ්ඩායම නියෝජනය කරමින් ජාත්‍යන්තර තරඟාවලීන්හි දී කේවල හා කණ්ඩායම් ජයග්‍රහණ රැසක් මෙන්ම ජාතික මට්ටමේ ප්‍රමුඛ ජයග්‍රහණද අත්කරගෙන ඇති බව නිරීක්ෂණය වේ. එනයින්, විනිවිදභාවයකින් තොරව සහ පූර්ව දැනුම්දීමකින් තොරව ඉදිරිපත් කරන ලද මෙකී අතාර්කික වර්ගීකරණය හේතුවෙන්, චෙස් ක්‍රීඩාවෙන් ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ විශිෂ්ට ජයග්‍රහණ අත්පත් කරගත් විශිෂ්ට සිසුවාගේ නීත්‍යානුකූල අපේක්ෂාවන් බිඳවැටීමට එකී අසාධාරණ ක්‍රමවේදය හේතු වී ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලබයි.

පාසල්හි ක්‍රීඩා වර්ණ ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙතෙක් කිසිදු බලපැවැත්වෙන චක්‍රලේඛයක් හෝ පටිපාටික මාර්ගෝපදේශ මාලාවක් සම්පාදනය කර නොමැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. එසේම, පාසල් ක්‍රීඩා වර්ණ පිරිනැමීමේදී දැනට පදනම් කරගනු ලබන මූලධර්ම ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයා ඇති නිර්ණායකයන් වන්නේ, වර්ණලාභී සිසුන් අවුරුදු 17 සපිරූ අය විය යුතුය යන්න සහ පිළිගත් ජාත්‍යන්තර තරගාවලියක් සඳහා නියෝජනය ලබා තිබිය යුතුය යන්න යන කොන්දේසි ද්විත්වය පමණි. එකී නිර්ණායකයන් සලකා බැලීමේදී, කිසිදු ක්‍රීඩාවක් වෙනුවෙන් විශේෂිත වූ ව්‍යතිරේකයන් හෝ ක්‍රීඩා අතර කිසිදු විභේදනයක්/කාණ්ඩගත කිරීමක් සිදු කර නොමැති බවද කොමිෂන් සභාව වැඩිදුරටත් නිරීක්ෂණය කරයි.

එකී කරුණු විශ්ලේෂණය කිරීමේදී, අදාළ ක්‍රියාවලිය තුළ අගතියට පත් සිසුවාගේ කුසලතාවන්ට සාපේක්ෂව සමාන හෝ අඩු මට්ටමේ ජයග්‍රහණ ලබා සිටි අනෙකුත් ක්‍රීඩකයින්ට ප්‍රමුඛතාවක් හා පිළිගැනීමක් ලබා දී ඇති බවත්; අගතියට පත් සිසුවා විසින් චෙස් ක්‍රීඩාවෙන් ජාතික හා ජාත්‍යන්තර

තලයේ අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයන්, පාසල විසින් යොදාගත් නිර්ණායක පදනම් කරගනිමින් අසාධාරණ ලෙස නොසලකා හැර ඇති බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. මෙම ක්‍රියාවලිය මගින් රාජ්‍ය පාසල් පද්ධතිය තුළ සිසුන්ගේ ක්‍රීඩා ජයග්‍රහණ නිසි ලෙස ඇගයීමට ලක් කිරීමේදී පවතින බරපතල පද්ධතිමය අඩුපාඩු සහ විෂමතාවයන් අනාවරණය වේ.

- මෙම සිදුවීම පාදක කරගනිමින් වින්දිත සිසුවා පාසල් පැමිණීම ප්‍රතික්ෂේප කරන බවට පැමිණිලිකාර පියා විසින් 2026.05.06 දින පැවැති පරීක්ෂණ අවස්ථාවේදී ප්‍රකාශ කර ඇත. ඊට ප්‍රතිචාර දක්වමින් වත්මන් විදුහල්පතිවරයා කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කරන ලද්දේ, දරුවා පාසල වෙත කඩිනමින් යොමු කරන ලෙසත්, විදුහල්පතිවරයා ලෙස තමන් සක්‍රීයව මැදිහත් වී, අදාළ දරුවා යළි පාසල වෙත ගෙන්වා, උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට සාමාර්ථ හිමිකර ගත හැකිවන පරිදි අධ්‍යයන පසුබිම සකසා දීමට තමා සූදානම් බවත්ය.

  විදුහල්පතිවරයාගේ එකී ප්‍රකාශය පරිදි, පැමිණිලිකාර පියා විසින් 2026.05.07 දින දරුවා ද කැටුව පාසල වෙත ගොස් විදුහල්පතිවරයා හමුවී දරුවා භාරදී ඇති අතර, ඒ අනුව දරුවා යථා පරිදි නැවත පාසල් අධ්‍යාපන කටයුතු සිදු කරන බව පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත තහවුරු කර ඇත. ඒ අනුව, අදාළ දරුවාගේ අධ්‍යාපන අයිතිය තහවුරු වී ඇති බව නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

2025 දෙසැම්බර් මස 30 වන දින පැවැත්වුණු මාතර රාහුල විද්‍යාලයීය වර්ණ ප්‍රදානෝත්සවයේදී 2023/2024 වර්ෂයට අදාළ දක්ෂතම ක්‍රීඩකයාට හිමි විශිෂ්ටතා සම්මානය පිරිනැමීමේදී පහත සඳහන් මූලික පටිපාටිගත දෝෂයන්, අක්‍රමිකතාවයන් සහ වෙනස් කොට සැලකීමේ පිළිවෙත් සිදුව ඇති බවට වන කරුණු මෙම කොමිෂන් සභාව හමුවේ සිදු කරන ලද පරීක්ෂණයේදී අනාවරණය වන අතර, එකී කරුණු අතුරින් බොහොමයක් වගඋත්තරකාර පාසල් අධිකාරිය විසින්ම නිල වශයෙන් පිළිගෙන ඇත. ඒවා පහත පරිදි වේ.

1. අයදුම්පත් කැඳවනු ලැබූ අවස්ථාවේදී හෝ ඊට ප්‍රථම, එකී සම්මානය සඳහා අයදුම්කරුවන් ඇගයීමට ලක්කෙරෙන නිශ්චිත ක්‍රමවේදය සහ නිර්ණායකයන් ප්‍රකාශයට පත් කිරීමට හෝ ප්‍රසිද්ධ දැනුම්දීමකට ලක් කිරීමට කටයුතු කර නොමැති වීම.
2. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීමට කටයුතු නොකිරීම මගින්, තමන්ගේ සුදුසුකම් සනාථ කිරීමට, සාක්ෂි ඉදිරිපත් කිරීමට සහ තමන් වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව අහිමි කර ඇත.
3. උක්ත විශිෂ්ටතා සම්මානය සඳහා තේරී පත් වූයේ කවරෙක්ද යන්න වර්ණ ප්‍රදානෝත්සව මොහොත දක්වාම ප්‍රසිද්ධියට පත් නොකිරීම මගින් තේරීම් ක්‍රියාවලියේ පාරදෘශ්‍යභාවය බිඳහෙලා .ඇත.

4. තේරීම් පටිපාටියෙන් අගතියට පත්වන අයදුම්කරුවන්ට ඊට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා ඉඩකඩක් ලබා දී නොමැත.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 2 වන ව්‍යවස්ථාවේ මෙලෙස සඳහන් වේ. "රජය විසින් ළමයාගේ උප්පත්තිය හෝ වෙනත් තත්ත්වයන් කුමක් වුවද, කවර හෝ ආකාරයෙන් මෙම ළමා සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් ගරු කිරීම සහ සහතික කිරීම කළ යුතුය".

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි (UN Convention on the Rights of the Child -UNCRC) 12 වන ව්‍යවස්ථාවේ ළමා සහභාගීත්වය (Child Participation) පිළිබඳව පැහැදිලිව සඳහන් වේ. මෙම වගන්තිය අනුව තමන්ට බලපාන ඕනෑම කරුණකදී ස්වාධීනව අදහස් ප්‍රකාශ කිරීමට ළමයාට අයිතියක් ඇති අතර, ළමයාගේ වයස සහ මුහුකුරා යාමේ මට්ටම අනුව එම අදහස්වලට සුදුසු බර තබා සවන්දිය යුතුය. විශේෂයෙන්ම ළමයාට බලපාන නීතිමය හෝ පරිපාලනමය ක්‍රියාමාර්ගවලදී ළමයාගේ හඬට ඉඩ දිය යුතුය. ළමයාට තමන්ට බලපාන තීරණ ගැනීමේදී තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සහ ඒ සඳහා ඇහුම්කම්දීමට ඇති අයිතිය මෙයින් තහවුරු වේ.

තවද 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතේ 5 වගන්තිය යටතේ ළමා අයිතිවාසිකම් දක්වා ඇත. එහි 5 (ඇ) අනුව දරුවන් විෂයෙහි නරක ලෙස සැලකීම, නොසලකා හැරීම, අපයෝජනය සහ අවතක්සේරු කිරීම යන ක්‍රියාවලින් දරුවන් ආරක්ෂා කර ඇත. කෙසේ වෙතත් 2025 දෙසැම්බර් මස 30 පැවති මාතර රාහුල විද්‍යාලයේ වර්ණ ප්‍රදානෝත්සවයේ දී 2023/2024 වර්ෂයට අදාළ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ප්‍රදානය කිරීමේ දී පෙර සඳහන් කරන ලද මූලික දෝශ සහ ක්‍රියාපටිපාටික අක්‍රමිකතා ආදී වගඋත්තරකාර පාර්ශවයේ පිළිවෙත් හේතුවෙන් වින්දිත සිසුවාට මෙන්ම අගතියට පත්වන අනෙකුත් පාසල් සිසුන්ටද නීති මගින් සලසා ඇති රැකවරණය වගඋත්තරකාර පාර්ශවය විසින් නොසලකාහැර ඇති බව පෙනී යයි .

තවද, උක්ත වර්ණ ප්‍රදානෝත්සවයේදී 2023/2024 වර්ෂයට අදාළ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය පිරිනැමීමේදී, අනෙකුත් ක්‍රීඩාවන් හා සසඳන විට චෙස් (Chess) ක්‍රීඩාවට සමානාත්මතාවයෙන් යුතු තත්ත්වයක් ලබා නොදීම සහ චෙස් ක්‍රීඩකයින් කෙරෙහි අසමාන හා වෙනස් කොට සැලකීමක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. වර්ණ ප්‍රදානෝත්සවයේදී යොදාගන්නා ලදැයි පැවසෙන නිර්ණායක ලේඛනයෙහි ක්‍රීඩා සුදුසුකම් යටතේ, ඔලිම්පික් තරග සඳහා අනුමත ක්‍රීඩාවන්ට (Olympic sports) ප්‍රමුඛත්වය හිමිවන බවට දක්වා තිබීම, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2020 දෙසැම්බර් 16 දිනැතිව නිකුත් කරන ලද අංක 35/2020 දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන් අභිබවා කටයුතු කිරීමක් බව නිරීක්ෂණය වේ.

එකී රාජ්‍ය චක්‍රලේඛය මගින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නිරත විය හැකි අනුමත ක්‍රීඩා 32 ක් නිශ්චිතව දක්වා ඇති අතර, එම සියලුම ක්‍රීඩාවන් එක හා සමාන පදනමක තබා සලකා ඇත. එහි කිසිදු ස්ථානයක යම් ක්‍රීඩාවකට අනෙක් ක්‍රීඩාවකට වඩා ප්‍රමුඛත්වයක් හෝ විශේෂ අනුග්‍රහයක් හිමිවිය යුතු බවට දක්වා නොමැත. එසේ තිබියදී, 2023/2024 වර්ෂයට අදාළ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය පිරිනැමීමේදී ඔලිම්පික් ක්‍රීඩා සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට කටයුතු කිරීම මගින් වගඋත්තරකාර පාසල් අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 35/2020 දරන චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කරමින් වින්දිත සිසුවා ඇතුලු ඔලිම්පික් ක්‍රීඩා නොවන ක්‍රීඩා හදාරන දරුවන්ට අසමාන සහ අසාධාරණ අයුරින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත මගින් සහ/හෝ එකී පනත ප්‍රකාරව නිකුත් කර ඇති ජාතික ක්‍රීඩා සංගම් නියෝග (අංක 2437/24 සහ 2025 මැයි 21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය) මගින් ද කිසිදු ක්‍රීඩාවක් අතර විභේදනයක් ඇති කර නොමැත. එකී ජාතික ක්‍රීඩා සංගම් නියෝග ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකාව තුළ පිළිගත් නිල ක්‍රීඩා වර්ග 74 ක් නෛතිකව දක්වා ඇති අතර, චෙස් ක්‍රීඩාව එහි අංක 29 යටතේ නිල වශයෙන් ස්ථානගත කර ඇත.

එනයින්, රටේ පවතින විධායක සහ ව්‍යවස්ථාපිත ක්‍රීඩා නීතියට පටහැනි වන පරිදි, ක්‍රීඩාවන් අතර අත්තනෝමතික විභේදනයක් ඇති කරමින් තේරීම් නිර්ණායක සකස්කර චෙස් ක්‍රීඩාව වැනි ඔලිම්පික් ක්‍රීඩා නොවන ක්‍රීඩා අඩු තක්සේරුවට ලක්කිරීම මගින් සමානාත්මතාවයේ සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ වින්දිත සිසුවාගේ හා ඔලිම්පික් ක්‍රීඩා නොවන ක්‍රීඩා හදාරන පාසලේ සිසුන්ගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාසල් අධිකාරිය විසින් නොසලකා හැර ඇති බව පෙනී යයි.

වර්ගීකරණයන් ඇති කිරීමේදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව *Haputhantirige and others v Attorney General (2007 1SLR 101)* නඩු තීන්දුවේදී විදෙස්නඩු තීන්දු උපුටා දක්වමින් මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇත. "A classification should not be irrational or arbittary. It must be reasonable and based on some real and substantial distinction, which bears a reasonable and just relation to the act in respect of which the classification is proposed and can never be made arbitrary and without any such basis." මෙම ප්‍රශ්නගත කරුණේ දී වගඋත්තරකරු විසින් ක්‍රීඩා අතර ඇති කර ඇති වර්ගීකරණයට තාර්කික හා සාධාරණ පදනමක් පවතින බවක් පැහැදිලි නොවේ.

තවද, ශ්‍රී ලංකාව යනු එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (UN Convention on the Rights of the Child - UNCRC) රාජ්‍ය පාර්ශවකරුවෙකු වන අතර, එකී සම්මුතිය මගින් පිළිගෙන ඇති ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රමිතීන්ට බැඳී සිටී.

එකී UNCRC සම්මුතියේ 31 වන ව්‍යවස්ථාව (Article 31) ප්‍රකාරව:

"සෑම ළමයෙකුටම විවේකය, විනෝදය, ස්වකීය වයසට සුදුසු ක්‍රීඩාවල සහ විනෝදාත්මක කටයුතුවල නිරතවීමේ අයිතිය මෙන්ම සංස්කෘතික හා කලාත්මක ජීවිතයට නිදහසේ සහභාගී වීමේ අයිතිය ඇත."

එනයින්, තමන් රිසි සහ කැමති ක්‍රීඩාවක නිදහසේ නිරත වීමට ඕනෑම ළමයෙකුට නෛතික හා විශ්වීය අයිතිවාසිකමක් ඇති අතර, ළමයෙකු විසින් ස්වකීය අභිමතය පරිදි තෝරාගෙන කැපවීමෙන් නිරත වන යම් ක්‍රීඩාවක්, තවත් ක්‍රීඩාවකට වඩා අඩු ප්‍රමුඛත්වයක තබා සැලකීමට හෝ විභේදනයට ලක් කිරීමට කිසිදු රාජ්‍ය පාලන අධිකාරියකට හෝ පාසල් පාලනාධිකාරියකට නෛතික බලයක් නොමැත.

වගඋත්තරකාර පාසල් අධිකාරිය විසින් 2023/2024 වර්ෂයට අදාළ දක්ෂතම ක්‍රීඩකයා තේරීමේ දී චෙස් ක්‍රීඩාව සහ එහි නිරත සිසුන් මෙන්ම ඔලිම්පික් ක්‍රීඩා නොවන ක්‍රීඩාවල නිරතවන පාසල් සිසුන් නොසලකා කටයුතු කිරීම මගින්, එම ක්‍රීඩාවන්හි නිරත සිසුන්ට UNCRC 31 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති ජාත්‍යන්තරව පිළිගත් මූලික ළමා අයිතිවාසිකම් සහ රැකවරණය නොසළකාහැර ඇති බව නිරීක්ෂණය වේ.

වසර 06ක් වැනි දීර්ඝ කාල පරිච්ඡේදයකට අදාළව පාසල් සිසුන්ගේ කුසලතාවයන් ඇගයීමට ලක්කිරීමේ සත්භාවීය චේතනාවෙන් භාරදූර කාර්යභාරයක් ලෙස භාරගෙන වර්ණ ප්‍රදානෝත්සවය පැවැත්වීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කරනු ලැබුවද, එම වර්ණ ප්‍රධානෝත්සවයේ දී සිදුව ඇති උක්තව දැක්වුණු පටිපාටිගත දෝෂයන්, පරිපාලනමය නොසලකා හැරීම්, රාජ්‍ය චක්‍රලේඛ විධිවිධාන අතික්‍රමණය කිරීම් සහ ව්‍යවස්ථාපිත හා ජාත්‍යන්තර ප්‍රමිතීන් අභිබවා කටයුතු කිරීම් සලකා බැලීමේදී, 2025 දෙසැම්බර් මස 30 වන දින පැවති මාතර රාහුල විද්‍යාලයීය වර්ණ ප්‍රදානෝත්සවයේදී 2023/2024 වර්ෂයට අදාළ දක්ෂතම ක්‍රීඩකයා තේරීම සඳහා වගඋත්තරකාර පාසල් අධිකාරිය විසින් අනුගමනය කරන ලද සමස්ත පටිපාටිය හේතුවෙන්, විත්දිත දිනුජය කොඩිතුවක්කු සිසුවාට සහ පාසලේ චෙස් ක්‍රීඩාවේ නිරත අනෙකුත් සිසුන්ට මෙන්ම ඔලිම්පික් තරග සඳහා අනුමත ක්‍රීඩාවන් නොවන ක්‍රීඩාවන්හි නිරත රාහුල විද්‍යාලයේ සිසුන්ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති "නීතිය හමුවේ සමානත්වය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

සාමාන්‍ය නීතිය තුළ සිදු වී ඇති හෝ චේතනාත්විතව සිදු කොට ඇති කිසියම් නීතියකට පටහැනි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් නිවැරදි කිරීමේ වගකීම රාජ්‍ය පාර්ශවයට පැවතිය යුතු නමුත් මෙම ප්‍රශ්නගත සිද්ධිය තුළ ළමයා යන සුවිශේෂී සිද්ධාන්තය මූලික වී ඇති බව හා ඍජුවම ළමයා යන සමාජ කොට්ඨාශයට මෙම නීත්‍යානුකූල යන කාර්යය බැඳී පැවතීම තුළ මෙකී සිදු වී ඇති ගැටලුසහගත ක්‍රියාවලිය ඒ ආකාරයෙන්ම නිවැරදි කිරීමේ හැකියාවක් ඇත්ද යන්න ගැටලුව මතු වේ. නීතිය ක්‍රියාත්මක කිරීමේදී සමාජයේ සංවේදී සහ විශේෂ කොටස් කෙරෙහි සුවිශේෂී වූ නීතිමය නම්‍යකරණය පැවතිය යුතු බව සමාජ පිළිගැනීම වේ. ඒ

අනුව මෙකී දෝශසහගත පාසල් වර්ණ ප්‍රධානය කිරීමේ ක්‍රියාවලිය තුළ නැවත වර්ණ ප්‍රධානයක් පැවැත්වීමට තීරණයකට පැමිණියහොත් එය පාසල් දරුවන්ට විශාල අගතියක් බවට පත්වීම නොවැලැක්විය හැකිය. එමඟින් එකී දරුවන්ගේ අධ්‍යාපන අයිතිය, සමාජ අයිතිය මෙන්ම අනාගත අපේක්ෂාවක් කෙරෙහි එකී තීරණයේ බලපෑම් ඇතිවිය හැකි බැවින් නැවත වර්ණ ප්‍රධානයක් පැවැත්වීම යෝග්‍ය නොවන බව කොමිෂන් සභාවේ අදහස වේ. එබැවින් ඉදිරියේ දී ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ වර්ණ ප්‍රධානය කිරීමේ ක්‍රියාවලිය තුළ මෙවැනි දෝශසහගත තත්වයන් සිදු නොවන ලෙස වගබලා ගැනීමේ නෛතිකමය යුතුකම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ පරිපාලනය තුළ පැවතිය යුතු බවට කොමිෂන් සභාව අවධාරණය කර සිටී.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

නිර්දේශ

1. ඉදිරියේ දී, මාතර රාහුල විද්‍යාලයේ වර්ණ ප්‍රදානෝත්සව පැවැත්වීමේදී, සියලුම ක්‍රීඩකයන් වෙත සමානාත්මතාවය හා සාධාරණත්වය තහවුරු වන පරිදි, විනිවිදභාවයකින් යුත් සහ කුසලතා පදනම් කරගත් විධිමත් නිර්ණායකයන්ගෙන් සමන්විත ක්‍රමවේදයක් සකස් කර අනුගමනය කළ යුතු අතර; එකී ක්‍රමවේදය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට මාතර රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කටයුතු කළ යුතුය. මාතර රාහුල විද්‍යාලය වෙතින් සකස් කරනු ලබන එකී ක්‍රමවේදය/පටිපාටිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නියාමනය කොට අධීක්ෂණයට භාජනය කළ යුතුය.

2. මින් ඉදිරියට දිවයිනේ සමස්ත පාසල් පද්ධතිය තුළ වර්ණ ප්‍රදානෝත්සව සංවිධානය කිරීම සහ පැවැත්වීම පිණිස අනුගමනය කළ යුතු ජාතික මට්ටමේ පොදු විධිවිධාන මාලාවක් හෝ නියාමන මාර්ගෝපදේශ සංග්‍රහයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සම්පාදනය කොට ක්‍රියාත්මක කළ යුතු වේ. එහිදී, මාතර රාහුල විද්‍යාලය විසින් යෝජනා කරනු ලබන ක්‍රමවේදය හා පටිපාටිය සාධාරණතා පදනමක් මත සැලකිල්ලට ගැනීමට හැකියාව පවතියි. තවද, දුෂ්කර ග්‍රාමීය පාසල් සහ පහසුකම් සහිත නාගරික පාසල් අතර පවතින ව්‍යුහාත්මක අසමතුලිතතාවන්, විෂමතාවයන් සහ සම්පත් සීමාකාරීත්වයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, එකී පොදු ක්‍රියාපටිපාටිය සමස්ත පාසල් පද්ධතියටම සාධාරණ වන අයුරින් හා විනිවිදභාවයකින් යුතුව සකස් කිරීම අත්‍යවශ්‍ය වන බව අවධාරණය කෙරේ.

3. මෙම සිද්ධිය පදනම් කරගෙන හෝ වෙනත් ඒ හා සමාන හේතූන් මත දිනුජය කොඩිතුවක්කු සිසුවා පාසල තුළ කිසිඳු අගතියකට, අසාධාරණයකට හෝ නොසලකා හැරීමකට ලක් නොකිරීමට මාතර රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් වගබලා ගත යුතුය.

2026. 10 . 22 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව මාතර රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙයින් දන්වා සිටිමු.

**එල්.ටී.බී. දෙහිදෙණිය,**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),**
**සභාපති,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**නිමල් ජී. පුංචිහේවා,**
**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : 1) ලේකම් - අ.ක.ස
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

2) අධ්‍යාපන අමාත්‍යතුමා - දැ.ගැ.ස
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.